# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
## දැන්වීමයි

මගේ අංකය : මාසකො/විධා/04/14 (I)

පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තම තනතුරේ ස්ථිර වූ මෙම අධිකාරියේ සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. <u>තනතුර : වග් යාත්‍රාපති - MLM 2</u>

I. **වැටුප් කාණ්ඩය:** MLM 2
මූලික වැටුප : රු. 82,505/=
වැටුප් වර්ධකය : රු. 1,585/=

II. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**
දළ බර ටොන් 500 කට අඩු වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන නැව්වල යාත්‍රාපතිවරයෙකු වශයෙන් සේවයේ නියැලීම පිණිස අධ්‍යක්ෂ (වෙළඳ නැව්) විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

අධ්‍යක්ෂ (වෙළඳ නැව්) විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන සහතිකයක් ලබා තිබීම.

**සමඟ**

**පළපුරුද්ද :**
උප වග් යාත්‍රාපති JLM තනතුරෙහි වසර පහ (05) ක ක්‍රියාකාරී පළපුරුද්ද

**හෝ**

උප වග් යාත්‍රාපති JLM තනතුරෙහි වසර තුන (03) ක ක්‍රියාකාරී පළපුරුද්ද සමඟ නාවික සුපරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් වසර දෙක (02) ක මුහුදු ගමන් පළපුරුද්ද

III. **තෝරා ගැනීමේ විශේෂ නිර්ණායක**
කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමක තිබිය යුතුයි.

02. <u>තනතුර : වරාය නිරාපද නිලධාරි - JLM</u>

I. වැටුප් කාණ්ඩය : JLM
මූලික වැටුප : රු. 75,065/=
වැටුප් වර්ධකය : රු. 1,440/=

II. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

ගිනි නිවීමේ ඉංජිනේරු ආයතනයේ (එක්සත් රාජධානිය) උපාධිධාරීත්ව විභාගයෙන් සමත් වී තිබීම හෝ තත්ත්ව, සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඒ හා සමාන සුදුසුකමක්

**සහ**

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් නිකුත් කරන ලද සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය පිළිබඳ සහතිකය

**සමඟ**

**පළපුරුද්ද :**

SG වැටුප් කාණ්ඩයේ අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක ක්‍රියාකාරී පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

III. **තෝරා ගැනීමේ විශේෂ නිර්ණායක**
පසුගිය ආසන්න වසර තුන (03) කාර්යසාධන සතුටුදායක මට්ටමක තිබිය යුතුයි.

02 පිටුවට .........



03. <u>තනතුර: ජ්‍යෙෂ්ඨ මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරි - JLM</u>

I. **වැටුප් කාණ්ඩය:** JLM
මූලික වැටුප : රු. 75,065/=
වැටුප් වර්ධකය : රු. 1,440/=

II. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**
වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන GT 3000 කට නොඅඩු නැව්වල යාත්‍රාපතිවරයෙකු වශයෙන් සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ වෙනත් උසස් මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන සහතිකයක් ලබා තිබීම.

**සහ**

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්‍ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද රේඩාර් නිරීක්ෂණ සහතිකය (Radar Observers Certificate) හෝ සමාන සහතිකයක් ලබා තිබීම.

**සහ**

ගෝලීය සමුද්‍ර අපදා සහ ආරක්‍ෂක පද්ධති (GMDSS) සහතිකය

**සමඟ**

**පළපුරුද්ද :**
SG වැටුප් කාණ්ඩයේ මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරී තනතුරෙහි වසර පහ (05) ක සක්‍රීය පළපුරුද්දක් ලබා තිබීම.

III. **තෝරා ගැනීමේ විශේෂ නිර්ණායක**
පසුගිය ආසන්න වසර තුන (03) කාර්යසාධන සතුටුදායක මට්ටමක තිබිය යුතුයි.

**සටහන :**
යහපත් කායික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ශ්‍රවණ හා දෘෂ්‍ය හැකියාවකින්යුක්ත විය යුතුය. (වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියළුම නීති රීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්‍ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක/ අංශයක සේවය කිරීමට බැඳී සිටී.

ආදර්ශ ආකෘතිපත්‍ර ප්‍රකාරව සකසන ලද අයදුම්පත් 2024-07 26 වෙනි දින හෝ ඊට පෙර ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ අදාළ කොට්ඨාශ/ අංශ ප්‍රධානියා මගින් එවිය යුතු වේ. ඒ සමඟ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත්ද අමුණා එවිය යුතු අතර, අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ/ අංශ ප්‍රධානීන් හෝ නේවාසික කළමනාකරු විසින් සඳහන් කළයුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් පරිපාලන)**
2024-07- 04 වෙනි දින.
මානව සම්පත් කොට්ඨාශයේදීය.

I/No

Source: www.slpa.lk (2024.07.16)